00014

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩ සටහන 2021/2022

අවසාන පරීක්ෂණය - 2023

**EPA2419/EPC2419/ESC2219 - පූර්ව ළමාවියේ කෙළි සෙල්ලම්**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.07.01 වේලාව - ප.ව 01.30 - ප.ව.04.30 දක්වා

---

පළමු වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## පළමු වන කොටස

01. 'සෙල්ලම්' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

02. කුඩා දරුවන්ට සෙල්ලම් කිරීමේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

03. කුඩා දරුවන් තුළ යහපත් පුරුදු සංවර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් දෙකක් (02) නිර්මාණය කරන්න.

04. සෙල්ලම්වල ලක්ෂණ තුනක් (03) ලියන්න.

05. ළමුන්ගේ මනෝ -චාලක සංවර්ධනයට සහාය වීම සඳහා ඔබ, සෙල්ලම් ක්‍රියාකාරකම් දෙකක් (02) සංවිධානය කර ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න කෙටියෙන් විස්තර කරන්න.

06. පෙරපාසල් දරුවන් සඳහා සුදුසු ශාරීරික සංවර්ධන ක්‍රියාකාරකම් හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

07. කථන හැකියාව වැඩි දියුණු කිරීමේ දී පෙරපාසල් දරුවන් සඳහා යොදාගත හැකි සෙල්ලම් ක්‍රියාකාරකම් දෙකක් (02) නිර්මාණය කරන්න.

08. පෙරපාසල් දරුවන්ගේ කායික සංවර්ධනය සඳහා යොදාගත හැකි ක්‍රීඩා දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. (i) පෙරපාසල් ළමුන් සඳහා සෙල්ලම් පිළිබඳ ව පියාජේ න්‍යාය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ගුරුවරියක ඉහත සඳහන් න්‍යාය පෙරපාසල් පන්ති කාමරයේ භාවිත කරන්නේ කෙසේ ද යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) කුඩා ළමුන් තුළ ගවේෂණාතමක සෙල්ලම් මගින් සංවර්ධනය කළ හැකි කුසලතා හතරක් **(04)** විස්තර කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් දරුවන් සඳහා ගවේෂණාත්මක සෙල්ලම් සැලසුම් කිරීමේ දී පෙරපාසල් ගුරුවරියක විසින් සලකා බැලිය යුතු සාධක මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) "සෙල්ලම් දරුවන්ගේ භාෂා සංවර්ධනයට සෘජු දායකත්වයක් දක්වයි."

ඔබ ඉහත වගන්තිය සමග එකඟ වන්නේ ද? හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් දරුවන්ගේ සවන්දීමේ කුසලතා සංවර්ධනය සඳහා යොදාගත හැකි ක්‍රියාකාරකම් තුනක් **(03)** උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) "ඉන්ද්‍රිය චාලක සෙල්ලම්" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 08)

(ii) මෙම ඉන්ද්‍රිය චාලක වයස් සීමාව තුළ දරුවන් භාවිත කරන ඉගෙනුම් ද්‍රව්‍ය පහක් **(05)** නම් කර එම ද්‍රව්‍ය භාවිත කර සංවර්ධනය කළ හැකි සංකල්ප/දක්ෂතා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i) "සෙල්ලම් දරුවන්ගේ බුද්ධිමය කුසලතා සංවර්ධනයට බෙහෙයින් දායක වෙයි." මේ සම්බන්ධයෙන් පෙරපාසල් ගුරුවරියකගේ වගකීම් කෙබඳු ද? (ලකුණු 10)

(ii) පෙරපාසල් වයසේ දරුවන් සඳහා නිවසේ දී සෙල්ලම් යොදා ගැනීම සම්බන්ධයෙන් දෙමාපියන්ගේ වගකීම කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.